## කඳුළු

පෝරුව මත නැගී දුව හෙළන කඳුළු
දැක මව්පියන්ගේ නෙත් පිරි තුටු කඳුළු
ගුරුවරු ඉදිරියේ වැගිරෙන තුති කඳුළු
මිණි මුතු වලට කවියන් සම කළ කඳුළු

පෙම් සටනකින් පැරදුණු තැන දුක් කඳුළු
නොකෙරුණ වරදකට දොස් පැවරෙන කඳුළු
මිනිස් ගති නොමැති මිනිසුන් දෙන කඳුළු
බීමත් පුරුෂයන්ගෙන් වධ වෙන කඳුළු

කළ වරදකට දඬුවම් දෙන ගිනි කඳුළු
පෝරකයට යමින් වගුරන බිය කඳුළු
ඉසි කෝ මාන පිරි සිත් නොසළන කඳුළු
මිනි කන කිඹුලු නෙත් අග ඇති බොරු කඳුළු

පළමු පෙමට පිටුපා යන විට කඳුළු
පෙම්වතියන් හෙළනා අසරණ කඳුළු
සැමියන් වණන විට පෙම්වතියගෙ කඳුළු
උපනෙත් වලට සැඟ වී නොපෙනෙන කඳුළු

දහසක් පැණැති ඉතිරීන් ඉවසන කඳුළු
වෙහෙසෙන නෙත් වලින් ගලනා සෝ කඳුළු
නැණ මද කමට ගැහැණුන් සලනා කඳුළු
කියමින් පිරිමි හිනැහෙත් තද කර කඳුළු

රූ රැ පිනියක් වූ දා හෙලු තුටු කඳුළු
රූමත් දුවක් බිහි කළ දා ගැලු කඳුළු
රූබර කම නිසා ඉවසන වධ කඳුළු
රූ සපුවට නිගා කර පැන යති කඳුළු

යුද බිය නිසා මුළු ලොව ගලනා කඳුළු
කුසගිනි ඇවිළ දරුවන් සළනා කඳුළු
සැමියන් හිතවතුන් වෙන් වන විට කඳුළු
ඉතිරීන් හෙළති කාටත් නොපෙනෙන කඳුළු

අයුක්තියක් පිළි ගෙන වගුරන කඳුළු
විමුක්තියක් වනු ඇත එන උණු කඳුළු
මිනිස්කමට කළ වරදට දුක් කඳුළු
යුක්තිය ඇති තැනක ඇත සැනසුම් කඳුළු

මල්ලිකා - බර්ලීන්

## දිගු සිහිනයක දවසක්දා

රතුවතින් සැරසුණු කුමරිය
දිලිසෙන නෙතු පියන් පත් හැර
දෙවියන් ඉදිරියේ හිඳ
ආවේද සනසන්න මගේ සිත

සීතල සුළඟට වෙව්ළමින්
තුරුළු වන්නට නොවන්නට මෙන්
අපි අපේ වගතුග සසඳමින්
ගත වූ නිමේෂය සුමිහිරි ය

රෝස මලකැයි කියා කිවු විට
නොපිපුණේ ද ඒ රෝස මල
වෙනත් මලකින්වත් ඔබට
පුදන්නට මල් ගොඩක් විය

පුංචි ළමයින් ලෙසින්
ළඳ බොළඳ වූ සැණෙන්
සිත ගියා අතීතෙට අපේ
පසු කරන් ආ ගමන්

බලන හැම මොහොතකම
නොහැකිය අහක බලනට
ඒ තරම් ලස්සන රුවක්
නොමැති තරම ය වෙනත් කෙනකුට

ඔය සිනාවෙන් මත් ව
කී දෙනකු මුසපත් වූව ද
ගිය අත්භවයට අනුව
අයිතිය මොහොතකට හෝ ඔබ මට

එවන් දිනයක් වෙතොත්
දුකෙන් තොර හෙටක් ඇත
ඉඩ දෙන්න මට
පිවිසෙන්න ඔබේ ජීවිතයට

මින් පෙර අන් කිසිවකුටවත්
නොදැක්වූ ආත්මීය ආදරයක්
ඔබට පිදුවේය මම
එහෙත් එය ඔබට වැටහේ ද??

දිවුරා කියූවෙන් දෙවියනට
නොහැක ඔබ හැර යන්නට
ලෙයින් වුව ලිවිය හැක
සදා ඔබගේය මම

එල්.ආර්. පෙරේරා

මෙම අනුවර්තනයට පාදක වූ මුල් ලිපිය මා උපුටා ගන්නේ ඩිමොක්‍රසි නව් [Democracy Now ] නම් වූ වෙබ් අඩවියේ ඇමී ගුඩ්මන් Amy Goodman සහ ජෝන් පර්කින්ස් [John Perkins ගේ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරිනි.

# ආර්ථික කුලී ඝාතකයෙකුගේ පාපොච්චාරණය

ජෝන් පර්කින්ස් සිය වෘත්තිය හඳුන්වා ගන්නේ ආර්ථික කුලී ඝාතකයා යන අරුත් ඇති ඉකොනොමික් හිට්මන් Economic Hitman යන නාමකරණයෙනි.

ඔහු ලොවට වැදගත් වන්නේ ඔහු විසින් ලියා පළ කළ ආර්ථික කුලී ඝාතකයෙකුගේ පාපොච්චාරණය

**මූලික වශයෙන්ම අපව පුහුණු කරල තිබ්බේ සහ අපගේ රාජකාරිය වූයේ ඇමරිකානු අධිරාජ්‍යය ගොඩ නැගීමේ ක්‍රියාවලියයි. ඇත්ත වශයෙන්ම අපි අතිශය සාර්ථක වුනා අනෙකුත් රටවල් තුල අවස්ථාවන් නිර්මාණය කිරීමෙන් සහ අපගේ සංස්ථා මෙන්ම රජයට අනෙකුත් රටවල තිබ්බ සම්පත් සහ ධනය එකතු කර ගැනීමේ ව්‍යාපෘති නිර්මාණය කරන්නට. අපි ඉතිහාසයේ දැවැන්තම අධිරාජ්‍යය ගොඩනැගුවා. ඇත්ත වශයෙන්ම එම කාර්යය සඳහා දෙවන ලෝක යුද්ධයෙන් පසු ගත වූ පසුගිය වර්ෂ 50 ක කාලය තුල අතිශය සුළු මිලිටරි මැදිහත් වීම් වලින් මෙන්ම අපගේ උපක්‍රම ද අතිශය සාර්ථක වුනා. ඉරාකය වගේ සුළු උදාහරණ කීපයක දී පමණක් මිලිටරි අංශයේ පිහිට පතන්නට සිදු වුනා.**

Confessions of an Economic Hitman නම් වූ ආන්දෝලනාත්මක පොත හේතුවෙනි. එම පොතේ සිංහල පරිවර්තනය සේපාල විජේසේකර විසින් සරසවි ප්‍රකාෂණයක් ලෙස ලංකාවේ පළ කර ඇති හෙයින් මේ ලිපිය එම පොත කියවීමේ වැදගත්කම ඉස්මතු කරන්නට කරනු ලබන ආරාධනාත්මක සංඥාවකි.

ඔහුගේ නවතම කෘතිය වන හුඩ්වින්ක්ඩ් Hoodwinked කෘතිය මේ නොවැම්බරයේ එළි දැක්වේ. එය ද වර්තමානයේ පවතින ලෝක ආර්ථික අර්බුදයේ මෙතුවක් හෙළිදරව් නොවූ බොහෝ දේ පිළිබඳ කරනු ලබන ව්‍යක්ත ඉදිරිපත් කිරීමක් බවත් එම අර්බුදයේ විසඳුම්වල ස්වාභාවය පිළිබඳ ඉඟි කරන බව ද විචාරකයන්ගේ මතයයි.

***ඇමී ගුඩ්මන්***
දැන් අපගේ ෆයර්හවුස් FireHouse Studio මැදිරිය හා සම්බන්ධ වන්නේ ජෝන් පර්කින්ස්. ඩිමොක්‍රසි නව් වෙත ඔබව සාදරයෙන් පිළිගන්නවා.

***ජෝන් පර්කින්ස්***
ස්තුතියි ඇමී. මෙතැනට එන්න ලැබීම ලොකු දෙයක්.

***ඇමී ගුඩ්මන්***
ඔබ අප සමග එක් වීම ලොකු සතුටක්. හොඳයි. ඔබ කියන්නා වාගේ මේ ආර්ථික කුලී ඝාතකයා යනුවෙන් පාරිභාෂිත වචනය ඉස්සෙල්ලම පැහැදිලි කරල ඉන්න.

***ජෝන් පර්කින්ස්***
මූලික වශයෙන්ම අපව පුහුණු කරල තිබ්බේ සහ අපගේ රාජකාරිය වූයේ ඇමරිකානු අධිරාජ්‍යය ගොඩ නැගීමේ ක්‍රියාවලියයි. ඇත්ත වශයෙන්ම







**පරිවර්තනය**
**ඊ ඒ ඩෝසන් ප්‍රීති**

අපි අතිශය සාර්ථක වුනා අනෙකුත් රටවල් තුල අවස්ථාවන් නිර්මාණය කිරීමෙන් සහ අපගේ සංස්ථා මෙන්ම රජයට අනෙකුත් රටවල තිබ්බ සම්පත් සහ ධනය එකතු කර ගැනීමේ ව්‍යාපෘති නිර්මාණය කරන්නට. අපි ඉතිහාසයේ දැවැන්තම අධිරාජ්‍යය ගොඩනැගුවා. ඇත්ත වශයෙන්ම එම කාර්යය සඳහා දෙවන ලෝක යුද්ධයෙන් පසු ගත වූ පසුගිය වර්ෂ 50 ක කාලය තුල අතිශය සුළු මිලිටරි මැදිහත් වීම් වලින් මෙන්ම අපගේ උපක්‍රම ද අතිශය සාර්ථක වුනා. ඉරාකය වගේ සුළු උදාහරණ කීපයක දී පමණක් මිලිටරි අංශයේ පිහිට පතන්නට සිදු වුනා. මෙම අධිරාජ්‍යය වෙනත් අනෙක් ඉතිහාසගත අධිරාජ්‍යයන්ට වඩා මූලික වශයෙන්ම ආර්ථික කළමනාකරණයෙන් රැවටීම් මගින් අල්ලස් මගින් මිනිසුන් අපගේ ජීවන ක්‍රමයන්ට පෙළඹවීම් මගින් සහ ආර්ථික කුලී ඝාතකයන් මගින් නිර්මාණය වුනා. මම ඒකේ ඉතා වැදගත් සංරචකයක් වුනා.

***ඇමී ගුඩ්මන්***
ඔබ කොහොමද එයින් එකෙකු වූයේ? ඔබ සේවා සැපයූවේ කාට ද ?

***ජෝන් පර්කින්ස්***
මම මුලින්ම සම්බන්ධ වුනේ ව්‍යාපාර අධ්‍යයන ආයතනයෙන් පසුව ඒ කියන්නේ නවසිය හැටගණන් වල ජාතික ආරක්ෂක ආයතනයට ඒ කියන්නේ ජාතියේ ලොකුම සහ ගුප්තම ඔත්තු සේවාවට N.S.A නමුත් මම අවසානයේ සේවා සැපයුවේ පුද්ගලික ආයතනවලට. ඇත්තටම නියම ආර්ථික කුලී ඝාතකයා කරලියට එන්නේ නවසිය පණස් ගණන්වල කර්මිට් රූස්වෙල්ට් ඒ කියන්නේ ටෙඩීගේ මුණුපුරා අර ප්‍රජාතාන්ත්‍රවාදී විදියට තේරිපත් වුන ඉරාන ආණ්ඩුව අත හැරල දාපු කෙනා සහ මොසාඩෙග්ගේ ආණ්ඩුව අර ටයිම් සඟරාව වර්ෂයේ කීර්තිමත් මිනිසා කියල නම් කළේ අන්න එයා. එයා තමයි කිසිම ලේ වැගිරීමකින් තොරව මේව කරල පෙන්නුවේ. හොඳයි පොඩි ලේ හෙල්ලිල්ලක් වුනා තමයි නමුත් මිලිටරි අතරමැදි වීමකින් තොරව ඉරානයේ ෂා බලයට ගෙනාවා මේ මොසඩැග් වෙනුවට. අන්න ඒ අවස්ථාවේ දී තමයි අපි තේරුම් ගත්තේ මේ ආර්ථික කුලී ඝාතකයා කියන භූමිකාවේ අතිශය වැදගත් කම.

අපි මේ විදියට වැඩ කරන් යද්දී රුසියාවෙන් අපට තිබ්බ සංග්‍රාම තර්ජන භීතිය සහමුලින්ම පහ වෙලා ගියා. ඒ එක්ක තිබ්බ එකම ප්‍රශ්නය වුනේ රූස්වෙල්ට් සී අයි ඒ ඒජන්තයකු වීමයි. එයා රජයේ වගකිව යුත්තෙක්. එයා එළිදරවු වුනා නම් හෙම අපි සෑහෙන ජංජාලයක පැටලෙනවා. එහෙම වුනා නම් විලි ලැජ්ජාවේ බැරුව යනවා. අන්න ඒ නිසා තමයි අපි වගේ ආර්ථික කුලී ඝාතකයන් සී අයි ඒ සහ එන් එස් ඒ වැනි සංවිධාන හරහා පුදගලික උපදේශන සමාගම් ඉංජිනේරු ආයතන ඉදිකිරීම් සමාගම් වගේ තැන්වලට අනුයුක්ත කෙරුණේ මොකද එතකොට අහු වුනත් කවදාවත් ආණ්ඩුවට දෝෂාරෝපණයක් වෙන්නේ නැති නිසා.

***ඇමී ගුඩ්මන්***
හොඳයි. විස්තර කරන්න ඔබ සේවා සැපයූ ආයතනය ගැන.

***ජෝන් පර්කින්ස්***
මම මැසචුසෙට්ස් වල බොස්ටන් චාස් ටී මේන් නම් වූ ආයතනයක වැඩ කළා. අපි සේරම එතන හිටියා 2000 ක විතර සේවකයන් ප්‍රමාණයක් මම එතන ප්‍රධාන ආර්ථික උපදේශකයා වශයෙන් වැඩ කළා. අවසානයේ දී සේවකයන් පණහක් මගේ යටතට එනතු ැ රාජකාරි කරා. නමුත් මගේ සැබෑ රාජකාරිය වුනේ ගනු දෙනු නිර්මාණ කිරීම. ඒ කියන්නේ වෙනත් රටවලට ණය පහසුකම් ලබා දීම ඒවා මහ විශාල මුදල් ඇත්තටම ඒ රටවලට නැවත ගෙවීමට නොහැකි තරම් විශාල ණය මුදල් තමයි ඒවා. ණය දීමේ දී පැණ වූ එක කොන්දේසියක් වුනේ අපි හිතමු ඩොලර් බිලියනයක් දෙනවා කියලා ඉන්දුනීසියාවට හරි ඉක්වදෝරයට හරි එහෙම නම් එම මුදලින් 90%ක් එම රට විසින් ඇමරිකානු සමාගමට හෝ සමාගම්වලට නැවත ගෙවිය යුතුයි මොකටද යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් ඒ කියන්නේ හැලිබර්ටන් හරි බෙචල් හරි සමාගමට. මේවා මහ විශාල මුදල්. ඊට පස්සේ මේ සමාගම් ගිහින් ඒ රටවල

41 වන පිටුවට